# ගොරකා යකා



කතාව සහ සිතුවම්
කායා විතානගේ.

# ගොරකා යකා

**කතෘ**

## ශයිලි කායා විතානගේ

**මහාමායා බාලිකා විදුහල**

**3 ශ්‍රේණිය C**

**කතෘගේ වෙනත් කෘති**

- ගෙදර යුද්ධයක්
- සරුංගල් හීනය
- කුණු කන අලි
- නංගිට ඔවදන්

**කෘතිය පළ කරන දිනය - 2026/05/10**

ISBN 978-624-211-236-7

# පිදුම

ආදරණීය රේණුකා මැඩම්, මදාරා මැඩම්, සමන්මලී
මැඩම් සහ මොරින් මැඩම් වෙත,

මේ මාගේ තුන්වන කතන්දර පොතයි.

ලේඛන කලාවට අත්පොත් තැබීමට ඔබතුමියන්ගෙන් ලද
දිරිය හා දිරිගැන්වීම් අපමණය. එබැවින් මෙම පොත
ඔබතුමියන් සියලු දෙනාට ගෞරවයෙන් පුද කරනු
ලබන්නේ, මා තුළ කියවීමේ හා ලිවීමේ හැකියාවන්
වර්ධනය කිරීමට ඔබ ලබාදුන් මගපෙන්වීම හා
දිරිගැන්වීම් සිහිපත් කරමිනි.

ඔබතුමියන්ගේ කැපවීම, සෙනෙහස සහ අගනා උපදෙස්
නිසාම මෙම කෘතිය නිර්මාණය කිරීමට මා හට ශක්තිය
හා ආත්මවිශ්වාසය ලැබුණි.

ඔබතුමියන් සියලු දෙනාටම මාගේ හෘදයාංගම
කෘතඥතාව පුද කරමින්, මෙම කතන්දර පොත
ගෞරවයෙන් පුදමි.

ආදරයෙන්,

කායා



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.


සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10



ඔන්න ඉස්සර කාලේ

ගමක හිටියා

ගමරාල කෙනෙක්.

එයා කාටවත් බය නෑ.



ගමරාලගේ ගෙදර තිබ්බේ කැලෑවක් ළඟ.

ඒ කැලෑවේ යකෙක් හිටියා.

මේ යකා එයාගේ විමානෙ හදන්න හොඳ ගහක් හොය හොය හිටියේ.



අන්තිමට එයාට හම්බවුණේ ගමරාලගේ වත්තේ කොනක තිබුණු ගොරකා ගහක්.

යකා ඒ ගොරකා ගහ උඩ යකාගේ විමානෙ හදාගන්නවා කියලා හිතලා ගහ උඩට නැග්ගා.

පහුවදා උදේම ගමරාල ගොරකා කඩන්න හිතාගෙන ගම හාමිනෙත් එක්ක ගොරක ගහ ළඟට ආවා.

ගමරාළ එනකොට එයාගේ පිහියත් ඉනේ ගහගෙන තමයි ආවේ.



යකා හිතුවා ගමරාල පිහිය
ගෙනාවේ යකාව මරන්න කියලා.
හොඳටම බයවුන යකා
වෙව්ලන්න පටන් ගත්තා.
එකපාරටම යකා
ගහෙන් බිමට වැටුනා.

ගම හාමිනේ බය වුණාට

ගමරාල නම් බය වුණේ නෑ.



ගමරාල යකාගේ කොණ්ඩෙන් ඇදගෙන ගිහින් යකාව එයාගේ ගෙදර ඉස්සරහින් එල්ලුවා.ආාය නම් කවදාවත් ගමරාලගේ ගේ පැත්තටවත් යක්කු ආවේ නෑ.



**අදට කතාව ඉවරයි.**

# කතුවරියගෙන් පණිවිඩයක්



**ආදරණීය චූටි නංගිලා සහ මල්ලිලා,**

**මෙම පොත ලියන අතරතුර මට මගේ ආදරණීය පන්තිභාර ගුරුතුමියත්, පළමු වසරේ සිට මේ දක්වා මට ඉගැන්වූ සියලුම ගුරුතුමියන්වත් නිතරම මතක් වුණා. මගේ අඩුපාඩු පෙන්වා දී, මා දිරිමත් කළ සියලුම ගුරුතුමියන්ටත්, ලේඛන කලාවට අපව යොමු කරන මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ගරු විදුහල්පතිතුමියටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.**

**ආදරයෙන්,**

**කායා විතානගේ**

**3 වසර** – C

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)